# පාරිභෝගිකයන්

# ලියාපදිංචිකිරීම/නැවත ලියාපදිංචිකිරීම පිළිබඳ

# උපදෙස් මාලාව

# පටුන

**පාරිභෝගිකයන් ලියාපදිංචි කිරීම / නැවත ලියාපදිංචි කිරීම පිළිබද උපදෙස් .......... 3**

1.1 **පොදු කරුණු ............................................................................ 3**

1.1.1.අවශ්‍යතා.............................................................................................3

1.1.1.1. නව පාරිභෝගිකයන්............................................................ 3

1.1.1.2 වත්මන් පාරිභෝගිකයන්........................................................ 3

1.1.2 ක්‍රියාපිළිවෙත............................................................................ 4

1.2 **ඡායාරූපය............................................................................ 4**

1.2.1 පාරිභෝගිකයා විසින් ඡායාරූපයක් ලබා දෙන්නේනම්.............................. 4

1.2.2 පාරිභෝගිකයා ඡායාරූපයකට පෙනී සිටින්නේ නම්.............................. 4

1.2.3 ඡායාරූපයක් ගන්නා ආකාරය.................................................... 5

1.2.4 ඡායාරූපය MMS කිරීමේ දී සැලකිය යුතු වැදගත් කරුණු ........................ 6

1.3 **පාරිභෝගිකයන් ලියාපදිංචි කිරීම / නැවත ලියාපදිංචි කිරීමේ අයදුම්පත සම්පූර්ණ කිරීම - පෙරගෙවුම් ........................................................................ 6**

1.4 **පාරිභෝගිකයන් ලියාපදිංචි කිරීම / නැවත ලියාපදිංචි කිරීමේ අයදුම්පත සම්පූර්ණ කිරීම - පසු ගෙවුම් ........................................................................8**

**ඇමුණුම** 1............................................................................................ 10

පාරිභෝගිකයන් ලියාපදිංචි කිරීම / නැවත ලියාපදිංචිය පිළිවෙත සදහන් ගැලුම් සටහන.........10

**ඇමුණුම** 2............................................................................................ 11

නිරන්තරයෙන් අසනු ලබන ප්‍රශ්න (FAQ`s) ...............................................11

**ඇමුණුම** 3............................................................................................14

පෙර-ගෙවුම් පාරිභෝගිකයන් ලියාපදිංචිකිරීමේ/නැවත ලියාපදිංචිකිරීමේ සම්පූර්ණ කළ ආදර්ශ අයදුම්පත...............................................................................14

**ඇමුණුම** 4............................................................................................ 15

පසු-ගෙවුම් පාරිභෝගිකයන් ලියාපදිංචිකිරීමේ / නැවත ලියාපදිංචිකිරීමේ සම්පූර්ණ කළ ආදර්ශ අයදුම්පත. ...............................................................................15

# පාරිභෝගිකයන් ලියාපදිංචි කිරීම / නැවත ලියාපදිංචි පිළිබඳ උපදෙස්

## 1.1 පොදු කරුණු

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL)විසින් ප්‍රකාශයට පත් කරන නියමයන්ට අනුව ආරක්ෂක හමුදා හෝ පොලිස් නිලධාරියෙකු විසින් ග්‍රාහකයෙකු භාවිතා කරන SIM පතේ හිමිකාරත්වය පිළිබඳව විමසා සිටි අවස්ථාවක එය සනාථ කිරීම සඳහා පාරිභෝගිකයන් ඔවුනගේ අදාළ ජංගම දුරකතන ජාලය යටතේ ලියාපදිංචි විය යුතුය.

ඉහත අවශ්‍යතාවය ඉටු කරමින් මොබිටෙල් ( පුද්ගලික) සමාගම විසින් දැනටමත් මොබිටෙල් සම්බන්ධතාවයක් හිමි සියළුම පාරිභෝගිකයන් සහ සියළුම නව පාරිභෝගිකයන් ලියාපදිංචි කිරීමට කටයුතු යොදා ඇති අතර ඒ සඳහා පිළිපැදිය යුතු උපදෙස් මාලාව පහත ඉදිරිපත් කෙරේ.

### 1.1.1 අවශ්‍යතා

සියලුම පාරිභෝගිකයන් ( දැනටමත් මොබිටෙල් සම්බන්ධතාවයක් හිමි / නව ) ලියාපදිංචිය සිදු කිරීම සඳහා මොබිටෙල් මධ්‍යස්ථාන වෙත පැමිණිය යුතු ය. දෙමව්පියෙකු හෝ භාරකරුවෙකු විසින් දරුවෙක් වෙනුවෙන් මොබිටෙල් සබඳතාවයක් ලබා ගන්නේ නම් දරුවා ද රැගෙන පැමිණිය යුතු ය .

#### 1.1.1.1. නව පාරිභෝගිකයන්

නව පාරිභෝගිකයා විසින් සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා සහ මොබිටෙල් මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කළ යුතු ලේඛණ පහත පරිදි වේ.

- i ජාතික හැඳුනුම්පත/ වලංගු විදේශ ගමන් බල පත්‍රය / රියදුරු බලපත්‍රය
- ii ඕනෑම මොබිටෙල් මධ්‍යස්ථානයක දී ඡායාරූපයක් (3.5cm x 4.5 cm) ලබා ගැනීමේ පහසුකම සලසා ඇත. නැතහොත් ඔබගේ මෑතකදී ගන්නා ලද පාස්පෝට් වර්ණ ඡායාරූපයක්
- iii පසු ගෙවුම් සම්බන්ධතාවයක් හෝ පසු ගෙවුම් බ්‍රෝඩ්බෑන්ඩ් සම්බන්ධතාවයක් ලබා ගන්නේ නම් පමණක් ලිපිනය සනාථ කිරීමට හැකි බිල්පත් වල පිටපතක්
- iv සමාගමක් යටතේ ලබා ගන්නා සම්බන්ධතාවයක් නම් සමාගම් ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් සහ සමාගමෙන් ලබා ගත් ලිපියේ පිටපතක් .

#### 1.1.1.2 වත්මන් පාරිභෝගිකයන්

මධ්‍යස්ථානය වෙත පැමිණෙන දැනටමත් මොබිටෙල් සම්බන්ධතාවයක් හිමි පාරිභෝගිකයින් විසින් ඉහත සඳහන් කළ අයිතමයන් (i-iv) ඉදිරිපත් කළ යුතු අතර ඒ සමගම ලියාපදිංචි කළ යුතු SIM පත ( හෝ SIM පත් ) ඉදිරිපත් කළ යුතු ය .

### 1.1.2 ක්‍රියාපිළිවෙත

- පාර්භෝගිකයාට ලියාපදිංචි කිරීමේ / නැවත ලියාපදිංචි කිරීමේ අයදුම්පත පිරවීමට උපදෙස් ලබා දෙන්න. පාර්භෝගිකයා විසින් ලියාපදිංචි කිරීමේ / නැවත ලියාපදිංචි කිරීමේ අයදුම්පත සදහා ඉදිරිපත් කළ ඡායාරූපය අදාළ ස්ථානයේ අලවන්න. එසේ නැතහොත් මධ්‍යස්ථානයේදී ලබා ගත් ඡායාරූපය MMS මාර්ගයෙන් එවන්න.
- තාවකාලික මොබිටෙල් හැදුනුම් සහතික පත (MIC) සම්පූර්ණ කර පාර්භෝගිකයාට භාර දී ඔහුගේ / ඇයගේ ලියාපදිංචි කළ ස්ථිර ලිපිනය වෙත මොබිටෙල් හැදුනුම් සහතික පත එවන බව දන්වා සිටින්න.

  **සටහන :-**ඔබ වෙත එවන ලද සියලුම තාවකාලික මොබිටෙල් හදුනාගැනීමේ සහතිකපත් සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම ඔබ විසින් දැරිය යුතුය. මෙම සහතිකපත් ඉහත ආකාරයට මොබිටෙල් පාර්භෝගිකයින්ට නිකුත් කිරීම හැර වෙනත් කිසිම අයෙකුට ලබා දීම සපුරා තහනම් වේ.

- ලියාපදිංචිය සාර්ථක වු පසු ඒ බව කෙටි පණිවිඩයක් මාර්ගයෙන් පාර්භෝගිකයාගේ ජංගම දුරකතනය වෙත දැනුම් දෙන බවත් අනතුරුව ඕනෑම අවස්ථාවක #132# යොදා SEND කිරීමෙන් ලැබෙන මොබිටෙල් ඩිජිටල් සහතිකපත (MDC) මාර්ගයෙන් SIM පතේ ලියාපදිංචි තොරතුරු පරීක්ෂා කළ හැකි බවත් දන්වා සිටින්න .

## 1.2 ඡායාරූපය

මොබිටෙල් අලෙවි මධ්‍යස්ථානයක දී නොමිලේ ඡායාරූපයක් ලබා ගැනීමට පහසුකම් සපයා ඇත. ඔහු / ඇය විසින් එයට අකමැති නම් පාර්භෝගිකයාට මෑතක දී ගන්නා ලද ඡායාරූපයක් ඉදිරිපත් කළ යුතු ය.

### 1.2.1 පාර්භෝගිකයා විසින් ඡායාරූපයක් ලබා දෙන්නේ නම්

පාර්භෝගිකයා විසින් ජයාරූපයක් ලබා දෙන්නේ නම් පහත අවශ්‍යතා සම්පූර්ණ කර තිබිය යුතුය.

i ඡායාරූපය සෙ.මී.3.5 x සෙ.මී.4.5 ප්‍රමාණයේ විය යුතු ය.

ii ඉදිරිපත් කරන ලද ඡායාරූපය මාස තුනකට වඩා පැරණි නොවිය යුතුය ( ඉදිරිපත් කළ දිනයේ සිට )

iii ඡායාරූපය, විදේශ ගමන් බලපත්‍රය සඳහා ඡායාරූප නියමයන්ට අනුකූල විය යුතු ය.

පාර්භෝගිකයා විසින් සපයන ලද ඡායාරූපය, ඔබගේ දුරකතන කැමරාවෙන් ඡායාරූප ගත කර MMS මාර්ගයෙන් 33333 හෝ reg@mobitel.lk වෙත එවීමෙන් අදාළ සබඳතාවය සක්‍රීය කළ හැක.

### 1.2.2 පාර්භෝගිකයා ඡායාරූපයකට පෙනී සිටින්නේ නම්

පාර්භෝගික මධ්‍යස්ථානයේ දී ඡායාරූපයකට පෙනී සිටින්නේ නම් පහත අවශ්‍යතා සම්පූර්ණ කර තිබිය යුතුය .

i පාර්භෝගිකයා කැමරාව වෙත මුහුණ යොමු කර තිබිය යුතු අතර ඔහුගේ / ඇයගේ දෙකන් හොඳින් ප්‍රදර්ශනය වී තිබිය යුතු ය

ii පාර්භෝගිකයා විසින් ඡායාරූපය ගන්නා අවස්ථාවේ දී හිස් වැසුම් , අව් කණ්නාඩි, මුහුණ ආවරණය වන ආකාරයේ වෙනත් පැලඳුමක් හෝ පැලඳ නොසිටිය යුතු ය .

iii සුදු පැහැති / ලා පැහැති පසුබිමක් ඉදිරියේ ඡායාරූපය ගත යුතු ය .

පාර්භොගිකයාගේ ඡායාරූපය ගැනීමේ දී

- පෙර ගෙවුම් සම්බන්ධතාවයක් ක්‍රියාත්මක කරන්නේ නම් යොදා ගන්නා දුරකතනය කැමරාවක් සහිත MMS විශේෂාංගයෙන් යුත් එකක් විය යුතු ය. ( අලෙවි නියෝජිතයින් සහ උප අලෙවි නියෝජිතයින් සඳහා )
- ඔබගේ දුරකතනයේ MMS SETTING ක්‍රියාත්මක කරවා ගැනීමට අපගේ පාර්භෝගික සේවා මධ්‍යස්ථානය අමතන්න.

- ගන්නා ලද ඡායාරූපය MMS කිරීම සඳහා් අලෙවි නියෝජිතයා හෝ උප අලෙවි නියෝජිතයා විසින් සම්බන්ධතාවය සක්‍රීය කිරීම සඳහා භාවිතා කළ අංකයම භාවිතා කළ යුතුය.
- මනා වූ අලෝක තත්වයක්.

ඡායාරූපයක් ගැනීම සඳහා ආසන්න වශයෙන් ගත වන්නේ මිනිත්තු දෙකක් වැනි සුළු කාලයකි .

### 1.2.3 ඡායාරූපය ගන්නා ආකාරය

**1 පියවර: කැමරාව ක්‍රියාත්මක කරන්න.**

දුරකතනයේ කැමරා බොත්තම තෝරා කැමරාව ක්‍රියාත්මක කරන්න. එහිදී ක්‍රියාත්මක කර ඇත්තේ වීඩියෝ මෝඩ් ( Video Mode ) නොව කැමරා මෝඩ් ( Camera Mode) දැයි හොඳින් පරීක්ෂා කර බලන්න.

**2 පියවර : Resolution පරීක්ෂා කර බලන්න.**

ඉන් පසුව කැමරාවේ Resolution මට්ටම තෝරා ගත යුතු ය. එය ඕනෑම දුරකතනයක Options තෝරා අනතුරුව Resolution තෝරා ගැනීමෙන් කළ හැකිය . Resolution මට්ටම අංක වශයෙන් හෝ තත්වය ( ඉහළ, පහළ) වශයෙන් සඳහන් වී ඇත. ඡායාරූපයේ තත්වයට Resolution මට්ටම බලපායි. එබැවින් ඔබට ඇත්තේ අංක වශයෙන් සඳහන් වුවත් නම් **අඩු අගය** තෝරා ගැනීම වඩාත් සුදුසු ය.

**3 පියවර : ආලෝක තත්වය තෝරාගන්න**

පාර්භෝගිකයා ඡායාරූපයට පෙනී සිටීමට සූදානම් වු විට ඔබට ඡායාරූපය ගැනීම සඳහා ආලෝක තත්වය සකස් කර ගැනීමට සිදු වනු ඇත. ඔබ ආලෝකයට පිටුපා සිටිය යුතු අතර ජංගම දුරකතනයේ කැමරාවේ කාචය දීප්තිමත් නොකර ඡායාරූපයට පෙනී සිටින පුද්ගලයා පමණක් ආලෝකමත් කළ යුතු ය .

**4 පියවර: දුරකතනය නොසෙල්වන ලෙස තබාගන්න**

ඡායාරූපය ගැනීමේදී පුද්ගලයා හොඳින් නාභිගත කිරීම සඳහා දුරකතනය නොසෙල් වී තබා ගත යුතු ය. යම් නිශ්චල වස්තුවක් ඔබ අසල වේ නම් එය ආධාරකයක් ලෙස ගනිමින් ඔබේ වැලමිට එහි තබා හොඳින් නාභිගත කර නොසෙල්වන ආකාරයෙන් ඡායාරූපය ලබා ගැනීමට කටයුතු කරන්න.

**5 පියවර: අවසාන සංස්කරණයන් සිදු කරන්න**

ජංගම දුරකතන තිරයේ දිස්වෙන ඔබ විසින් ගන්නා ලද ඡායාරූපය තව දුරටත් සංස්කරණය කළ යුතු වේ නම් දුරකතනයේ කැමරා විශේෂාංගය භාවිතයෙන් තවදුරටත් සංස්කරණය කරන්න.

**6 පියවර : අංක 33333 වෙත හෝ reg@mobitel.lk වෙත MMS කරන්න. MMS එවන විට එය නිවැරදිව ක්‍රියාත්මක කිරීම සහ එහි සඳහන් තොරතුරු දත්ත පද්ධතියට ( Data Base) එක් කිරීම සඳහා එහි SUBJECT යන්න පහත පරිදි සඳහන් විය යුතු ය .**

**මොබිටෙල් අංකය - ජාතික හැදුනුම්පත් අංකය**

**උදා. 071234567 - 811111111 v**

### 1.2.4 ඡායාරූපය MMS කිරීමේ දී සැලකිය යුතු වැදගත් කරුණු

- MMS පණිවිඩියේ SUBJECT සඳහා පාර්භෝගිකයාගේ සම්පූර්ණ මොබිටෙල් අංකය සහ ජාතික හැදුනුම්පත් අංකය ඉහත ආකාරයට සඳහන් කරන්න.
- ඉහත ආකාරයට සිදු නොකල හොත් MMS පණිවිඩය ප්‍රතික්ෂේප කළ බව දන්වා SMS පණිවිඩයක් එවනු ඇත.
- MMS පණිවිඩය 100kBට වඩා කුඩා විය යුතු ය .

## 1.3 ලියාපදිංචි කිරීමේ / නැවත ලියාපදිංචි කිරීමේ අයදුම්පත සම්පූර්ණ කිරීම - පෙර ගෙවුම්

**(ඇමුණුම 3 බලන්න.)**

- බෝල්පොයින්ට් පෑනක් භාවිතයෙන් පමණක් අයදුම්පත පිරවිය යුතු ය .
- අයදුම්පත පුරවන විට අදාළ එක් කොටුවක එක් අකුරක් බැගින් සඳහන් කළ යුතු අතර වචන / නම් අතර කොටුවක් අත් හැරිය යුතුයි.
- ඡායාරූපය අදාළ කොටුවේ මැලියම් භාවිතයෙන් අලවන්න. ඒ සඳහා ඇමුණුම් කටු යොදා ගැනීමෙන් වලකින්න.

**අයදුම්පතෙහි අංක වලින් දක්වා ඇති තොරතුරු පිරවීමේ දී පහත උපදෙස් පිළිපදින්න.**

- අංක 1: පාර්භෝගිකයා විසින් අදාළ නොවන වචන කපා හැරිය යුතු ය.
- අංක 1: ජාතික හැදුම්පතේ / වලංගු විදේශ ගමන් බලපත්‍රයේ / රියදුරු බලපත්‍රයේ සඳහන් ආකාරයට නම සඳහන් කළ යුතු ය.

- අංක 2: අයදුම්පත පුරවන්නා විසින් ජාතික හැඳුනුම්පත් අංකය /වලංගු විදේශ බලපත් අංකය පැහැදිලිව එක් කොටුවක එක් අංකයක් බැගින් වන ලෙස සදහන් කළ යුතු ය .
- අංක 3: සම්බන්ධතාවය භාවිතා කරන්නාගේ හෝ භාවිතා කිරීමට යන දරුවාගේ (වලංගු අනන්‍යතා ලියකියවිලි ඉදිරිපත් කළ නොහැකි බාල වයස්කරුවන්) නම යොදන්න. මෙහිදී සමාගම් නාමය යන්න කපා ඉවත් කරන්න.
- අංක 4: තැපැල් මගින් යවන ලියවිලි සඳහා පාරිභෝගිකයා විසින් ලබා දෙන ස්ථිර ලිපිනය මෙරට ලිපිනයක් විය යුතු ය. මොබිටෙල් හැඳුනුම් සහතිකපත (MIC) එවනු ලබන්නේ මෙම ලිපිනයටය.
- අංක 5: පාරිභෝගිකයා දැනට රැකියාවේ නියුතු අංශය සදහන් කරන්න.
- අංක 6: සිය සංනිවේදන අවශ්‍යතා වෙනුවෙන් මාසයක කාලයක් සඳහා අයදුම්කරුට වෙන් කල හැකි මුදල සදහන් කොටුව ඉදිරියේ සලකුණු කරන්න.
- අංක 7: පවුලේ ජංගම දුරකතන භාවිතා කරන්නන් සංඛ්‍යාව සහ පවුලේ සාමාජිකයන් සංඛ්‍යාව ඉලක්කමෙන් සදහන් කරන්න.
- අංක 8: මොබිටෙල් සමාගම විසින් පාරිභෝගිකයා සමගින් ලිපි, දුරකතන ආදිය මගින් සංනිවේදනය කළ යුතු භාෂාව කුමක් දැයි මෙහි සදහන් කරන්න .
- අංක 9: පාරිභෝගිකයාගේ SIM කාඩ් අසුරනයේ සදහන් මොබිටෙල් අංකය මෙහි පැහැදිලිව සදහන් කළ යුතුය .
- අංක 10: පාරිභෝගිකයාගේ සිම් කාඩ් අසුරනයේ පිටුපස සදහන් අංක 19කින් යුත් SIM කාඩ් අංකය මෙහි සදහන් කළ යුතු ය .
- අංක 11: පාරිභෝගිකයා වෙත නිකුත් කරනු ලබන තාවකාලික MIC කාඩ් අංකය මෙහි සදහන් කල යුතුය .
- අංක12,13,14,15,16,17,18: පිරවිය යුත්තේ මොබිටෙල් සබඳතාවය අළෙවි කරන නියෝජිතයා විසින් පමණි.
- අංක12: එහි සදහන් ලියවිලි ඇද්දැයි පරීක්ෂා කරන්න. එහි නැත සදහන් කළ හොත් මොබිටෙල් සමාගම විසින් අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ඇත.
- අංක 13: ඔබ විසින් මධ්‍යස්ථානයේදී පාරිභෝගිකයාගේ ඡායාරූපයක් ලබා ගන්නා ලද්දේ නම් අදාළ කොටුවේ ඒ බව සදහන් කරන්න .
- අංක 14: ගන්නා ලද ඡායාරූපයක් හෝ ලබා දී ඇති ඡායාරූපය, පාරිභෝගිකයාගේ මුහුණේ ස්වරූපය හා ගැලපෙන්නේ දැයි ඔබ විසින් පරීක්ෂා කළ බැලිය යුතු ය. එසේ නොගැලපෙන අවස්ථාවන්හි දී මොබිටෙල් සමාගම විසින් අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ඇත .
- අංක 15: නම සහ ලිපිනය සදහන් උප අළෙවි නියෝජිත / අළෙවි නියෝජිත / මොබිටෙල් මධ්‍යස්ථානයේ මුද්‍රාව යොදන්න. මුද්‍රාවේ සදහන් තොරතුරු වලංගු නොවන අවස්ථාවන්හි දී අතින් පිරවිය යුතු වේ .
- අංක 16: ඔබට අදාළ බලයලත් නියෝජිත අංකය සදහන් කරන්න.
- අංක 17: ඔබට අදාළ උප අළෙවි නියෝජිත අංකය සදහන් කරන්න.
- අංක 18: MMS සම්බන්ධතාවය ක්‍රියාත්මක කිරීමට භාවිතා කළ අංකය සදහන් කරන්න.
- අංක 19: අළෙවි කරන්නාගේ ජාතික හැඳුනුම්පත් අංකය මෙහි සදහන් කරන්න.

## 1.4 ලියාපදිංචි කිරීමේ / නැවත ලියාපදිංචි කිරීමේ අයදුම්පත සම්පූර්ණ කිරීම - පසු ගෙවුම්

**( ඇමුණුම 4 බලන්න )**

- බෝල්පොයින්ට් පෑනක් භාවිතයෙන් පමණක් අයදුම්පත පිරවිය යුතු ය .
- අයදුම්පත පුරවන විට අදාළ එක් කොටුවක එක් අකුරක් බැගින් සඳහන් කළ යුතු අතර වචන / නම් අතර කොටුවක් අත් හරින්න .
- ඡායාරූපය අදාළ කොටුවේ මැලියම් භාවිතයෙන් අලවන්න.ඒ සඳහා ඇමුණුම් කටු යොදා ගැනීමෙන් වළකින්න.

**අයදුම්පතෙහි අංක වලින් දක්වා ඇති තොරතුරු පිරවීමේ දී පහත උපදෙස් පිළිපදින්න.**

- අංක 1: පාරිභෝගිකයා විසින් අදාළ කොටුව තුළ සළකුණු කළ යුතු ය.
- අංක 2: මුලකුරු සමග වාසගම සඳහන් කරන්න.
- අංක 3: ජාතික හැදුම්පතේ / වලංගු විදේශ ගමන් බලපත්‍රයේ / රියදුරු බලපත්‍රයේ සඳහන් ආකාරයට නම සඳහන් කළ යුතු ය.
- අංක 4: අයදුම්පත පුරවන්නා විසින් ජාතික හැදුනුම්පත් අංකය වලංගු විදේශ බලපත් අංකය පැහැදිලිව එක් කොටුවක එක් අංකයක් බැගින් වන ලෙස සඳහන් කළ යුතු අතර විදේශ ගමන් බලපත්‍රයක් නම් අදාළ රට සඳහන් කරන්න.
- අංක 5: සියළුම ලියවිලි එවිය යුතු ලිපිනය සඳහන් කරන්න.
- අංක 6: බිල් පතේ සඳහන් විය යුතු ලිපිනය ස්ථිර පදිංචි ලිපිනයට වඩා වෙනස් නම් මෙහි සඳහන් කරන්න
- අංක 7: ඔබව සම්බන්ධ කර ගත හැකි ඔබගේ නිවසේ හෝ කාර්යාලයේ දුරකතන අංකය, කාර්යාලයේ ෆැක්ස් අංකය හා ඊමේල් ලිපිනය ලබා දෙන්න.
- අංක 8: භාවිතා කරන්නා සම්බන්ධ කල නොහැකි අවස්ථාවන් හි දී සම්බන්ධ විය හැකි පුද්ගලයෙක් සහ දුරකතන අංකයක් ලබා දෙන්න.
- අංක 9: මොබිටෙල් සමාගම විසින් පාරිභෝගිකයා සමගින් ලිපි, දුරකතන ආදිය මගින් සංනිවේදනය කළ යුතු භාෂාව කුමනක් දැයි මෙහි සඳහන් කරන්න .
- අංක 10: සම්බන්ධතාවය ලබා දී ඇත්තේ සමාගමක් යටතේ නම් ව්‍යාපාර ලියාපදිංචියේ සඳහන් වන ආකාරයට නම සඳහන් කරන්න.
- අංක 11: ලියාපදිංචි හිමිකරු සම්බන්ධතාවය භාවිතා කරන්නා නොවේ නම් ( උප සම්බන්ධතා / බාල වයස්කරුවන් ) භාවිතා කරන්නාගේ නම, (User Name ) ජාතික හැදුනුම් පත් අංකය මෙහි සඳහන් කරන්න.
- අංක 12: පාරිභෝගිකයාගේ SIM පත් අසුරනයේ සඳහන් මොබිටෙල් අංකය මෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය. එහි ඉතිරි කොටු මොබිටෙල් නිලධාරියෙකු විසින් පිරවිය යුතුය .
- අංක 13: පාරිභෝගිකයාගේ SIM කාඩ් අසුරනයේ පිටුපස සඳහන් අංක 19 කින් යුත් SIM කාඩ් අංකය මෙහි සඳහන් කළ යුතු ය.
- අංක 14: පාරිභෝගිකයා වෙත නිකුත් කරනු ලබන තාවකාලික MIC කාඩ් අංකය මෙහි සඳහන් යුතුය .

- අංක 15: වීඩියෝ / සාමාන්‍ය ඇමතුම් තෝරාගන්නා නම් ඇමතුම් සැලසුම (Tariff Plan ) තෝරන්න .
- අංක 16: බ්‍රෝඩ් බෑන්ඩ් සේවාව තෝරාගන්නේ නම් ඇමතුම් සැලසුම තෝරන්න.
- අංක 17: තෝරා ගත් ගෙවීමේ මාධ්‍ය සදහන් කරන්න.
- අංක 18: සම්බන්ධතාවය වෙනුවෙන් අය කෙරෙන තැන්පතු ගාස්තුව / ජාත්‍යන්තර ඇමතුම් තැන්පතු ගාස්තුව සහ ඊට අදාළ රිසිට් අංකය / අංක මෙහි සදහන් කරන්න.
- අංක 19: සිය සන්නිවේදන අවශ්‍යතා වෙනුවෙන් මාසයක කාලයක් සදහා අයදුම්කරුට වෙන් කළ හැකි මුදල සදහන් කොටුව ඉදිරියේ සලකුණු කරන්න.
- අංක 20: පාරිභෝගිකයා දැනට රැකියාවේ නියුතු අංශය සදහන් කරන්න. ඔහු / ඇය සතුව ව්‍යාපාරික කාඩ්පතක් ( Business Card ) ඇත්නම් එය අමුණන්න.
- අංක 21: ඔබ යම් වෘත්තීය ආයතනයක සාමාජිකයෙක් නම් ඒ සම්බන්ධ තොරතුරු ලබා දෙන්න.
- අංක 22: ජංගම දුරකතන භාවිතා කරන සංඛ්‍යාව හා පවුලේ සාමාජික සංඛාව ඉලක්කමෙන් සදහන් කරන්න.
- අංක 23: අංක 12 හි සදහන් ලියකියවිලි තිබේදැයි පරීක්ෂා කරන්න. එසේ නොමැති අවස්ථාවන් හිදී මොබිටෙල් සමාගම විසින් අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ඇත.
- අංක 24: ඔබ විසින් මධ්‍යස්ථානයේදී පාරිභෝගිකයාගේ ඡායාරූපයක් ලබා ගන්නා ලද්දේ නම් අදාළ කොටුවේ ඒ බව සදහන් කරන්න .
- අංක 25: ගන්නා ලද ඡායාරූපයක් හෝ ලබා දී ඇති ඡායාරූපය, පාරිභෝගිකයාගේ මුහුණේ ස්වරූපය හා සැසදෙන්නේ දැයි ඔබ විසින් පරීක්ෂා කළ බැලිය යුතු ය. එසේ සැසදේන්නේ නොමැති අවස්ථාවන්හි දී මොබිටෙල් සමාගම විසින් අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ඇත.
- අංක 26: නම සහ ලිපිනය සදහන් උප අළෙවි නියෝජිත / අළෙවි නියෝජිත / මොබිටෙල් මධ්‍යස්ථානයේ මුද්‍රාව යොදන්න. මුද්‍රාවේ සදහන් තොරතුරු වලංගු නොවන අවස්ථාවේ දී අතින් පිරවිය යුතු වේ.
- අංක 27: අළෙවි කරන්නාගේ ජාතික හැදුනුම්පත් අංකය මෙහි සදහන් කරන්න. දිනය සදහන් කර අත්සන් කරන්න.

# ඇමුණුම 1

## පාරිභෝගිකයන් ලියාපදිංචි කිරීම / නැවත ලියාපදිංචිය පිළිවෙත සඳහන් ගැලුම් සටහන



## ඇමුණුම 2

## නිරන්තරයෙන් අසනු ලබන ප්‍රශ්න (FAQ`s)

**පොදු**

1. මා ලියාපදිංචි විය යුත්තේ ඇයි ?

ආරක්ෂක හමුදාව විසින් හෝ පොලිස් නිලධාරීන් විසින් SIM පතේ (පාරිභෝගිකයන් හඳුනා ගැනීමේ මොඩියුලය ) හිමිකාරත්වය සනාථ කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවක එය ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ( TRCSL ) නියමයන්ට අනුකූලව සියලුම ජංගම දුරකතන පාරිභෝගිකයන් ඔවුන්ගේ අදාළ ජංගම දුරකතන ජාලයන් යටතේ ලියාපදිංචි විය යුතු වෙයි .

2. ලියාපදිංචිය/ නැවත ලියාපදිංචිය සඳහා මා විසින් ගාස්තුවක් ගෙවිය යුතු ද ?

නැත

**පිළිවෙත**

3. ලියාපදිංචිය / නැවත ලියාපදිංචිය සඳහා මාවිසින් රැගෙන ආ යුත්තේ මොනවා ද ?

- අ ) ජාතික හැඳුනුම්පත / වලංගු විදේශ ගමන් බලපත්‍රය / රියදුරු බලපත්‍රය
- ආ) ඕනෑම මොබිටෙල් මධ්‍යස්ථානයක දී ඡායාරූපයක් (සෙ.මී.3.5 X සෙ.මී.4.5 ) ලබා ගැනීමේ පහසුකම සලසා ඇත. නැතහොත් ඔබගේ මෑතකදී ගන්නා ලද පාස්පෝට් වර්ණ ඡායාරූපයක්
- (ඇ) පෙර ගෙවුම් හා පසු ගෙවුම් සාමාන්‍ය ඇමතුම් හෝ බ්‍රෝඩ් බෑන්ඩ් සබඳතාවයක් ලබා ගන්නේ නම් පමණක් ලිපිනය සනාථ කල හැකි බිල්පත් වල පිටපතක්
- (ඈ) සමාගමක් යටතේ ලබා ගන්නා ලද සම්බන්ධතාවයක් නම් සමාගම් ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් සහ සමාගමෙන් ලබා ගන්නා ලද ලිපියක්.

ඔබට දැනටමත් මොබිටෙල් සම්බන්ධතාවයක් හිමිනම් පහත ලියවිලි ඉදිරිපත් කරන්න.

- i ලියාපදිංචි කළ යුතු SIM පත. ( හෝ SIMපත් )
- ii ජාතික හැඳුනුම්පත / වලංගු විදේශ ගමන් බලපත්‍රය / රියදුරු බලපත්‍රය .
- iii මෑතක දී ගන්නා ලද පාස්පෝට් ප්‍රමාණයේ (සෙ.මී.3.5xසෙ.මී.4.5) වර්ණ ඡායාරූපයක් .
- iv පෙර ගෙවුම් හා පසු ගෙවුම් සාමාන්‍ය ඇමතුම් හෝ බ්‍රෝඩ් බෑන්ඩ් සබඳතාවයක් ලබා ගන්නේ නම් පමණක් ලිපිනය සනාථ කල හැකි බිල්පත් වල පිටපතක්.
- v සමාගමක් යටතේ ලබා ගන්නා ලද සම්බන්ධතාවයක් නම් සමාගම් ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් සහ සමාගමෙන් ලබා ගන්නා ලද ලිපියක් .

**සටහන:**

ඔබ තවම ජාතික හැඳුනුම්පතක් ලබා නොමැති නම් ඔබේ දෙමාපියන් / භාරකරු සමග පැමිණ අදාළ ඉහත සඳහන් ලේඛණ ඉදිරිපත් කරන්න.

ඉහත (ආ) / iii සඳහන් අයුරින් ඔබ සතු ඡායාරූපයක් නොමැත්තේ නම් අපගේ මධ්‍යස්ථාන වල දී ගාස්තුවකින් තොරව ඔබගේ ඡායාරූපයක් ගත හැකිය .

4. මට ලියාපදිංචි විය හැක්කේ කුමන ස්ථානයකින් ද ?

පහත සදහන් මධ්‍යස්ථාන වලදී සියළුම නව සහ දැනටමත් මොබිටෙල් සම්බන්ධතාවයක් හිමි පාරිභෝගිකයන් හට ලියාපදිංචිය නැවත ලියාපදිංචිය සිදු කළ හැක.

- මොබිටෙල් ශාඛා
- ශ්‍රී ලංකා ටෙලිකොම් ටෙලිෂොප් ශාඛා
- ශ්‍රී ලංකා ටෙලිකොම් ප්‍රාදේශීය කාර්යාල
- සිංගර් මෙගා
- තෝරාගත් මොබිටෙල් බලයලත් නියෝජිත වෙළද සැල්
- ආර්පිකෝ සුපර් සෙන්ටර් හයිඩ්පාක් කෝනර්

05. මා ලියාපදිංචි වූ පසු ඒ බව මට දැනුම් දෙන්නේ ද ?

ඔව්. ලියාපදිංචිය සාර්ථක වු පසු ඒ බව SMS මාර්ගයෙන් ඔබට දැනුම් දෙනු ඇත.

06. ලියාපදිංචියට පසු මට හැදුනුම් සහතිතපතක් හිමි වේ ද?

ඔව්. තාවකාලික මොබිටෙල් හැදුනුම් සහතිකපතක් ( MIC) ඔබට ලැබෙන අතර පසුව අප විසින් ඔබගේ ස්ථිර ලිපිනය වෙත මොබිටෙල් ස්ථිර හදුනාගැනීමේ සහතිකය එවනු ලැබේ .

07. මගේ SIM පතට අදාළ මොබිටෙල් ඩිජිටල් සහතිකය ( MDC ) ලබා ගන්නේ කෙසේ ද ?

#132# යොදා SEND කරන්න. එවිට ඔබට ඔබේ;

- මොබිටෙල් අංකය:
- නම:
- ජාතික හැදුනුම්පත් අංකය:
- SIM අංකය:

ජංගම දුරකතන තිරයේ දිස්වනු ඇත

**වෙනත් කරුණු**

08. මගේ ජාතික හැදුනුම් පතේ / වලංගු විදේශ ගමන් බලපත්‍රයේ / මෙරට රියදුරු බලපත්‍රයේ සඳහන් ලිපිනය දැනට පදිංචි ස්ථිර ලිපිනයට වඩා වෙනස් නම්

ගැටළුවක් නොවේ . ඔබේ SIM පත ඔබ දැනට පදිංචිව සිටින ලිපිනය යටතේ ලියාපදිංචි කළ හැකිය

09. මම ශ්‍රී ලාංකිකයෙකු නොවෙමි . මා ලියාපදිංචි විය යුතු ද ?

ඔව්. ඔබට ඉහත අංක 3 යටතේ සඳහන් පිළිවෙලම අනුගමනව කරමින් ලියාපදිංචි විය යුතුය

10. මා වෙනත් තැනකින් මිල දී ගත් SIM පතක් ලියාපදිංචි කිරීම කළ හැක්කේ කෙසේ ද ?

ඔබට ඉහත අංක 4 සඳහන් ඕනෑම ස්ථානයකින් ලියාපදිංචි විය හැකිය .

11. මා වෙනුවෙන් මාගේ SIM පත ලියාපදිංචි කිරීම වෙනත් අයෙකුට පැවරිය හැකි ද ?

නොහැකිය. ඔබගේ හිමිකාරිත්වය තහවුරු කිරීම සඳහා ඔබටම පැමිණීමට සිදු වේ .

12. මාගේ මොබිටෙල් සම්බන්ධතාවය යටතේ දුරකතන කිහිපයක් ඇත. මට ඒ සියල්ල ලියාපදිංචි කිරීමට සිදු වේ ද ?

ඔබගේ නම යටතේ දුරකතන අංක කිහිපයකට අදාළ SIM පත් ලියාපදිංචි කර ඇත්තේ නම් ඔබ ඒ සියල්ලම එකවිට භාවිතා නොකරනවා විය හැක. එම SIM පත් අනෙක් අය විසින් භාවිතා කරන්නේ නම්, ඔවුන්ගේ නම් යටතේ ඒවා ලියාපදිංචි කරන ලෙස ඔබ ඔවුන්ට දන්වා සිටිය යුතුය. කෙසේ වුව ද ඔබ යම් අවශ්‍යතාවයක් වෙනුවෙන් එක් SIM පතකට වඩා භාවිතා කරන්නේ නම් ඒවා වෙන් වෙන්ව ලියාපදිංචි කිරීම අනිවාර්යය වෙයි .

13. මම මේ වන විටත් වෙනත් ජාලයක් යටතේ ලියාපදිංචි වී ඇත්තෙමි. මොබිටෙල් සම්බන්ධතාවය සඳහා මා මොබිටෙල් ජාලය යටතේත් ලියාපදිංචි විය යුතු ද ?

ඔව්. මොබිටෙල් සම්බන්ධතාවය සඳහා මොබිටෙල් ජාලය යටතේත් ලියාපදිංචි විය යුතුය .

14. මගේ ලියාපදිංචි කළ SIM පත නැති විය. මගේ නව SIM පත නැවත ලියාපදිංචි කිරීමට අවශ්‍ය ද ?

නැත. ඔබ විසින් පෙර දී ලියාපදිංචි කළ අංකයමට නව SIM පත ලියාපදිංචි කලේ නම් එම තොරතුරු මොබිටෙල් තොරතුරු පද්ධතියේ ඇතුළත් වී ඇති බැවින් නැවත ලියාපදිංචිය අනවශ්‍යය. නමුත් මොබිටෙල් හැදුනුම්පත් සහතිකයක් නැවත ලබා ගත යුතුය .

**ඔබ ලියාපදිංචි නොවුවහොත්…**

විදුලි සංදේශ නියාමන කොමිෂම විසින් නිකුත් කළ රෙගුලාසි අනුව සෑම ජංගම දුරකතන පාරිභෝගිකයෙකුම ලියාපදිංචි වීම අනිවාර්ය වේ.

## ඇමුණුම 3

## පෙර-ගෙවුම් පාරිභෝගිකයන් ලියාපදිංචි කිරීමේ /නැවත ලියාපදිංචි කිරීමේ සම්පූර්ණ කළ ආදර්ශ අයදුම්පත

Sri Lanka Telecom Mobitel
We Care. Always.

**SMART PRE-PAID APPLICATION FOR REGISTRATION / RE-REGISTRATION**

Photograph (3.5cm x 4.5cm)

1. Name as stated in NIC or Passport: (Ven/Rev/Dr/Mr/Mrs/Ms)
JAYAMAHAGE MALITH BANDARA

2. NIC No / Passport No (For Non Sri Lankan Nationals): 810493356V — Country

3. If Company, Specify Company Name / If user is a child, specify child's name

4. Permanent Address
NO: 228/1A, RUHUNU ROAD
DEHIYATTAKANDIYA
District: AMPARA
E mail — Telephone No: 063-330550

5. Occupation: Government ✓ / Private / Self Employed / Student

6. Amount you are willing to spend on communication a month (Rs.):

| Below 100 | 100-250 | 250-500 | | 500-1000 | 1000-3000 | Above 3000 |
|---|---|---|---|---|---|---|
| | | | ✓ | | | |

7. Number of members in the family using mobile phones: 2 — Number of family members: 5

8. Preferred Language of Communication: Sinhala ✓ / Tamil / English

9. Mobile No: 0713281106

10. SIM No: 89940112111930336 50

11. Serial Number of the temporary MIC: 2345678

I/We declare that the information given by me/us is true and correct. I/We have read and understood the terms and conditions overleaf and duly filled this application and hereby agree to be bound by the said terms and conditions.

Signature of Customer: [signature] Date: 01/08/2008

---

12. ✓
13. ✓
14. ✓
15. MOBILE TELECOM (PVT) LTD
NO: 123, MAIN ROAD
DEHIATTAKANDIYA

16. PMTL — 17. AMP00001

18. 0713281107

19. 752191298V — [signature] — 01/08/2008

SMART

## ඇමුණුම 4

## පසු-ගෙවුම් පාරිභෝගිකයන් ලියාපදිංචි කිරීමේ/නැවත ලියාපදිංචි කිරීමේ සම්පූර්ණ කළ ආදර්ශ අයදුම්පත.



Sri Lanka Telecom Mobitel
We Care. Always.

**POST-PAID APPLICATION FOR REGISTRATION/RE-REGISTRATION**

A digital photograph of you will be taken at our Center at no cost. If you do not wish to be photographed at the Center, you should be present in person and provide your photograph, conforming to the specifications of the Passport (Size:3.5cmX 4.5cm) photograph

**Personal Information of the owner** (Please fill in block letters) (Information marked by Asterisks (*) are compulsory)

1 Mr. ✓ Mrs. Ms. Dr. Rev. Other:

2 Name with Initials (Name on the bill will appear as mentioned above): Y . M . SIVANKARA *

3 Name as in NIC or Passport: YASAS MUDIYANSELAGE SIVANKARA *

4 NIC No./Passport No. (For Non Sri Lankan Nationals): 811360678V Country

5 Billing Address (If the billing proof is not produced the credit limit will be equal to your refundable deposit): NO: 23/1A, SIR RICARDO HADLEE MW COLOMBO 06 * District

6 Permanant Address: NO: 02, SEA STREET AMBALANGODA District GALLE

7 Contact Details Home(Tel) 0112330550 * E-mail Sivym@gmail.com
Office(Tel) 0112330551 Fax 0112330396

8 Person to be contacted: (In case we are unable to contact you) Name: I. AMARASURIYA
Contact No. 2507385

9 Preferred language for communication ✓ English Sinhala Tamil *

10 **Company Details** Company Name Business Registration No.
VAT Registration No. (If a VAT invoice is necessary please include the VAT registration No.)

11 **User Details (If the current user is not the owner of this connection or is a child)**
User's Name
NIC Number
Current Address
Signature:

**Mobile Details**

12 Mobitel Number 0712755777 Account No. Group Code

13 SIM No. 8994011211193033650

14 Serial Number of the temporary MIC: 7234567

15 **Voice/Video** ✓ Tariff Plan DOUBLE M1000 * 16 **Mobile BroadBand** Tariff Plan

**Other Services** ✓ Detailed Bill (O/G only) **Other Services**

17 **Payment Method** 1) SMS Payments ✓ 2) On line Payments 3) Credit card standing instruction

18 **Refundable Deposit**
Local Call/IDD Deposit
Value 2000
Receipt No. 1219999

**Other Information**

19 Amount you are willing to spend on communication a month (Rs.): Rs. 100 - 499 Rs. 500 - 999 ✓ Rs. 1000 - 4999 Above Rs. 5000

20 Occupation (Please attach your business card) Government ✓ Private Self Employed Student

**Other Information**

21 **Professional Membership** Professional Body Membership Status Student Associate/Regular Corporate Senior

22 Number of members in the family using mobile phones 2 Number of family members 5

**Declaration**

I/We confirm that the information provided is true and correct. I/We also confirm that I/we have read the terms and conditions overleaf and are bound by them.

Date DD MM YYYY 01 08 2008 Signature Rubber Stamp (If Company):

**Seller's Statement**

I/We hereby declare the information given below have been verified by me/us.

23 Checked NIC/Passport/Driving License Yes ✓ No 24 Photograpgh of the Customer was taken Yes ✓ No 25 Customer's face matches the Photograph Yes ✓ No

26 Name and Address of Dealer/Seller: XYZ COM (PVT) LTD NO: 25 MAIN ROAD COLOMBO 03

27 Signature Date 01/08/2008 NIC Number of Dealer/Seller 768621837V

**Office Use Only**

Credit Limit: 1) VIP 2) Referral based 3) Deposit based 4) Evaluation based

1) For VIP customers: Description
2) Referred by (Mobitel staff member)
Name: Designation: Division:

Activated by: Date:

**Mobitel (Pvt.) Ltd.**, 108, W.A.D Ramanayake Mawatha, Colombo 02. Hotline 0712755777, Fax - 2330396, Website - www.mobitel.lk